**<u>ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය</u>**

**<u>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව</u>**

**<u>ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ආශ්‍රිත නිලධාරී සේවා ගණය) ධීවර නිලධාරී III ශ්‍රේණිය සඳහා</u>**

**<u>බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015</u>**

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුරෙහි පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා දැනට දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු සුදුසුකම්ලත් නිලධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. උක්ත විභාගය 2016 අප්‍රියෙල් මාසයේදී කොළඹ දී පමණක් පැවැත්වීමට කටයුතු කෙරෙනු ඇත.

**01. සේවා කොන්දේසි :**
රජයේ සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද , රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 6/2006(IV) අනුව සකසා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති MN-04-2006 A බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් කොන්දේසි වලටද යටත්ව තෝරා ගනු ලැබේ. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.

**02. වැටුප් කාණ්ඩය සහ පරිමාණය :**
වැටුප් කේත අංකය : MN-4- 2006 A

වැටුප් පරිමාණය : රු.15,215-10 x 215-4x240-7x320-15x360-25,965

**03. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ධීවර විද්‍යාවට අදාළ විෂයන්ගෙන් උපාධියක් ලබා, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

හෝ

ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර පරීක්ෂක තනතුරෙහි ස්ථිර කර ඇති හා වසර 10 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**04. වෘත්තීය සුදුසුකම් :**අදාළ නොවේ

**05. කායික සුදුසුකම් :**
සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

**06. පළපුරුද්ද :** අදාළ නොවේ.

**07.වෙනත් :**

I. පූර්වාසන්න වසර 05 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
II. සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
III. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට ප්‍රථම සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**08.වයස් සීමාව :** අදාළ නොවේ

**09.බඳවා ගැනීමේ ක්‍රමය :**

ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණු වල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක්, සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර කුසලතාවයේ අනුපිළිවෙල මත සුදුස්සන් තෝරාගනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවා ගනු ලැබේ.

(අ) බඳවා ගැනීමේ තරග විභාගය, සිංහල හා දෙමළ භාෂා දෙකෙන් පමණක් පවත්වනු ඇත.

(ආ) බඳවා ගැනීමේ තරග විභාගයට ඉල්ලුම්කරුවෙකු තමන් ඉල්ලූ භාෂා මාධ්‍යයෙන් සියළුම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයෙහි සඳහන් භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අපේක්ෂකයකුට අවසර නොලැබේ.

**10.ලිඛිත විභාගය**

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1.බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | පැය 01 | 100 | 40% |
| 2.ධීවර පනත හා රෙගුලාසි | පැය 01 | 100 | 40% |
| 3.ධීවර කළමනාකරණය | පැය 01 | 100 | 40% |

| **ප්‍රශ්ණ පත්‍රයේ නම** | **විෂය නිර්දේශය** |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය හා අභියෝග්‍යතාව | අපේක්ෂකයාගේ තර්කානුකුල විවරණ සහ විග්‍රහ ශක්තිය හා නිවැරදිව සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනුම හා බුද්ධිය පිළිබඳව මැනීම අරමුණු කොට ගෙන මෙය සම්පාදනය කරනු ලැබේ. මෙය ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම, පරිසරය හා ආශ්‍රිත ප්‍රශ්ණ ඇතුලත් බහුවරණ ප්‍රශ්ණ පත්‍රයකි. |
| 2. ධීවර පනත හා රෙගුලාසි | 1996 අංක 02 දරණ ධීවර හා ජලජ සම්පත් පනත<br>ධීවර හා ජලජ සම්පත් පනත යටතේ පනවා ඇති නියෝග<br>ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය<br>ධීවර සංවිධාන මූලධර්ම සහ ප්‍රතිපත්ති<br>උසාවි කාර්ය පරිපාටිය<br>ආශ්‍රිත ප්‍රශ්ණ ඇතුලත් බහුවරණ හා කෙටි ප්‍රශ්ණ ඇතුලත් ප්‍රශ්ණ පත්‍රයකි. |

| | |
|---|---|
| 3. ධීවර කළමනාකරණය | කළමනාකරණය පිළිබඳ මූලික අවබෝධය<br>ධීවර සම්පත් ප්‍රශස්ථ භාවිතය හා තිරසාර ලෙස උපයෝගී කර ගැනීම උදෙසා වන ක්‍රමෝපායන්<br>මසුන් පරිහරණය හා පසු අස්වනු තාක්ෂණය<br>උසාවි කාර්ය පරිපාටිය<br>දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය පිළිබඳ අවබෝධය. |

**11.විභාග ගාස්තු :**

විභාග ගාස්තුව රු. 500/- ක් වන අතර මෙම ගාස්තුව විභාග ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනට පළමුව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ නමින් ලංකා බැංකුවේ ටොරින්ටන් ශාඛාවේ ගිණුම් අංක 2323278 දරණ ගිණුමට බැර වන ලෙස ගෙවිය යුතුයි. ලබා ගන්නා ලදු පත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතුයි. ලදු පතෙහි ඡායා පිටපතක් අයදුම්කරුවන් විසින් තමන් ළඟ තබා ගැනීම යෝග්‍ය වේ. මෙම විභාග ගාස්තු කිසිම හේතුවක් මත ආපසු ගෙවනු නොලැබේ.

**12.ඉල්ලුම් කිරීමේ ක්‍රමය :**

අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසිවල මෙම නිවේදනයේ අග දක්වා ඇති ආකෘතිය අනුව සකස් කර ගත යුතුය. එම ආකෘතියේ 01 සිට 2.6 තෙක් ශීර්ෂ පළමුවන පිටුවටද , 3.1 සිට 4.4 තෙක් දෙවන පිටුවටද , ඉතිරිය තුන්වන පිටුවටද වන ලෙස තම අයදුම්පත්‍රය පිටු 03 කින් යුක්ත විය යුතුය. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද ,දෙමළ ඉල්ලුම්පත්‍ර වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

දැනට ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු සේවයේ නියුක්ත නිලධාරීන් විසින් එවනු ලබන අයදුම්පත්, අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට කලින් ඉහත පළමු ඡේදයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ස්වකීය අංශ ප්‍රධානි / දිස්ත්‍රික් ධීවර සහකාර අධ්‍යක්ෂ මාර්ගයෙන් එවිය යුතුය. ධීවර හා ජලජ සම්පත් අධ්‍යක්ෂ ජනරාල්ගේ පෞද්ගලික නමට හෝ වෙනත් නිලධාරියෙකුගේ පෞද්ගලික නමට හෝ අයදුම්පත් නොඑවිය යුතුය. මෙම නිවේදනයේ අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් **2016.03.24** දිනට හෝ එදිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව, නව මහ ලේකම් කාර්යාලය, මාලිගාවත්ත, කොළඹ 10." යන ලිපිනයට ලැබෙන සේ ***ලියාපදිංචි තැපෑලෙන්*** එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලූ කවරයේ වම් පස ඉහළ කෙළවරේ " **ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ (ආශ්‍රිත නිලධාරී සේවා ගණය) ධීවර නිලධාරී III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරඟ විභාගය - 2015** " යනුවෙන් සඳහන් කළ යුතුය.

නියමිත සුදුසුකම් සපුරා නැති හෝ සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය ලැබුණු බව දන්වනු නොලබන අතර, අයදුම්පත්‍රය හෝ ඒ හා සම්බන්ධ ලිපියක් හෝ තැපෑලේදී නැතිවූ බවට කරන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. එබැවින් නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත් එවීම අයදුම්කරුගේ වගකීම වේ.

**13.විභාගයට ඇතුළත් වීම :**

(අ) අදාළ විභාග ගාස්තු ගෙවා නිසි ලෙස ඉල්ලුම්පත් සම්පූර්ණ කර නියමිත දිනට පෙර එවා ඇති සියළුම ඉල්ලුම් කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු විසින් නිසි පරිදි අත්සන සහතික කළ තම ප්‍රවේශ පත්‍රය විභාග ශාලාධිපතිට ඉදිරිපත් කළ යුතුයි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේකෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ඇ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කරන ලද නීති රීති උල්ලංඝනය කළහොත් අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදු වනු ඇත.

**14.අපේක්ෂකයාගේ අනන්‍යතාවය :**

තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන් ම ශාලාධිපති සෑහීමට පත්වන අයුරින් අපේක්ෂකයෙකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. මේ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ඇත.

1. පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පතක්
2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක්
3. වලංගු රියදුරු බල පත්‍රය

**15.පත් කිරීම සඳහා තෝරා ගැනීම :**

ලිඛිත විභාගයේ එක් එක් විෂයට ලකුණු 40% කට නොඅඩුව ලබා ගන්නා අපේක්‍ෂකයින්ගේ මුළු ලකුණු කුසලතාව අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන පිරිසක් සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණය සඳහා කැඳවා බඳවා ගනු ලැබේ.

**16.සාවද්‍ය තොරතුරු සැපයීම :**

අපේක්ෂකයෙකු සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයෙකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක්, ඔහු එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙලි වුවහොත් එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු ඕනෑකමින් යටපත් කර ඇති නම් ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත. මෙම රෙගුලාසිවල සලකා නොමැති කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරන පරිදි කටයුතු කෙරෙනු ඇත.
සිංහල හා දෙමළ මාධ්‍ය වලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂාවලින් පළකිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.

අධ්‍යක්ෂ ජනරාල්
ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව
මාලිගාවත්ත
කොළඹ 10
2016.